**ශීර්ෂය 303 - පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව**

-----------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්වාගණනය කල මතය

පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 ජූලි 01 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූනි 13 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්වාගණනය කල මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත් එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථාවක් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස දැක්වීම |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 267/2018 හි 7(VI) උප වගන්තිය අනුව අක්මුදල් ගැලපීම් ගිණුමක් පිළියෙල කළ යුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 267/2018 අක්මුදල් ගැලපීම් ගිණුමක් පිළියෙල කළ යුතුය. | 2019 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී නියමිත සැසඳුම් ගිණුම ඉදිරිපත කිරීමට සටහන් කර ගනිමි. |
| (ආ) | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය 7.2 ඡේදය ප්‍රකාරව ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් ආදායම් එකතුකරනු ලබන වෙනත් දෙපාර්තමේන්තු එම ආදායම් භාණ්ඩාගාරයෙන් ලද අක්මුදල් සේ සලකා තම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ඇතුලත් කල යුතු වුවද , බදු නොවන ආදායම් හා වෙනත් යටතේ රු.6,811,803 ක් ඇතුලත් කර තිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 267/2018 ප්‍රකාරව ගිණුම් පිළියෙල කළ යුතු වීම. | මෙම දෙපාර්තමේන්තුව විසින වෙනත් ආදායම් ගණන්දීමේ නිළධාරීන් වෙනුවෙන් ආදායම් එකතු කරනු නොලැබේ. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

**(අ)මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස දැක්වීම |
|---|---|---|---|
| (i) | දෙපාර්තමේන්තුව සතුව කටුබැද්ද සංකීර්ණය සහ තවත් ස්ථාන 9 ක ගොඩනැගිලි 15 ක් පවතින අතර එම ගොඩනැගිලි සහ ඉදිකිරීම් නිවරදිව තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි. මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයට ගොඩනැගිලි සහ ඉදිකිරීම් රු.3,000 ක් පමණක් සටහන් කර තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය පිළියෙල කළ යුතු වීම. | ගොඩනැගිලි හා ඉදිකිරීම් තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත තොරතුරු ඉදිරිපත් කර ඇති අතර අවස්ථා කීපයකදී විමසීම් සිදු කරන ලද නමුත් මෙතෙක් තක්සේරු වාර්තා ලබා දී නොමැත.ගොඩනැගිලි යටතේ රු.3000 ක වැරදි සටහනක් ඇතුලත් වී ඇති අතර එය පරිගණක පද්ධතියෙන් ඉවත් කරන ලෙස භාණ්ඩාගාරයෙ |

| | | | |
|---|---|---|---|
| | | | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත වාර්තා කර ඇත.කඩිනමින් එය නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි සහ ඉදිකිරීම් සඳහා රු.2,712,855 ක් හා වාහන වැඩිදියුණු කිරීම් සඳහා රු. 648,115 ක් වියදම් දරා තිබුණද, මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි. | -එම- | අදාළ පරිදි නිවැරදි කිරීමට කටයුතු කරමි |
| (iii) | 2018 වර්ෂයේ විකුණන ලද රු.1,350,000ක් පිරිවැය වූ වාහන 02 ක් පිළිබඳ විස්තර මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයට ඇතුලත් කර නොතිබුණි. | -එම- | වාහන අපහරනයන්ට අදාළ නියමිත සටහන් තබා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iv) | මගී වාහන රු. 17,350,000 ක වටිනාකම (විකුණුම් වාහන වටිනාකම අඩු කල පසු) මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා නොතිබුණි. | -එම- | නිරීක්ෂණ සමඟ එකඟ වේ. |
| (v) | වගකීම් යටතේ දේපල පිරියත උපකරන සංචිත රු.35,792,825 ක වටිනාකම ඇතුලත් කර නොතිබුණි. | -එම- | නිරීක්ෂණ සමඟ එකඟ වේ. |

**(ආ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව අග්‍රිම ශේෂය රු.97,895,850ක් වූ අතර භාණ්ඩාගාර සටහන් අනුව ශේෂය රු.244,188,750 ක් වූයෙන් රු.146,292,900 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය පිළියෙල කළ යුතු වීම. | නිරීක්ෂණ සමඟ එකඟ වේ. |

| | | | |
|---|---|---|---|
| (ii) | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව තැන්පත් ලැබීම් රු.6,690,909 ක් වූ අතර භාණ්ඩාගාර සටහන් අනුව ශේෂය රු.9,697,739 ක් වූයෙන් රු.3,006,830 ක වෙනසක් නිරීක්ෂණය විය. | -එම- | නිරීක්ෂණ සමඟ එකඟ වේ. |
| (iii) | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව අත්තිකාරම් මුදල් ලැබීම් රු.2,018,015 ක් වූ අතර භාණ්ඩාගාර සටහන් අනුව ශේෂය රු.5,932,313 ක් වූයෙන් රු.3,914,298 ක වෙනසක් නිරීක්ෂණය විය. | -එම- | නිරීක්ෂණ සමඟ එකඟ වේ. |
| (iv) | පුනරාවර්තන වියදම් යටතේ ගමන් වියදම්,සැපයීම් හා නඩත්තු වියදම් එකතුව රු.5,981,341 ක් ඇතුලත් කර නොතිබුණි. | -එම- | නිරීක්ෂණ සමඟ එකඟ වේ. |

**(ඈ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස දැක්වීම |
|---|---|---|---|
| (i) | මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.4,132,504 ක් අඩුවෙන් සටහන් කර තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතු වීම. | නිරීක්ෂණ සමඟ එකඟ වේ. |
| (ii) | ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.360,000 ක් වැඩියෙන් සටහන් කර තිබුණි. | -එම- | නිරීක්ෂණ සමඟ එකඟ වේ. |
| (iii) | මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු 3,772,504 ක් වැඩියෙන් සටහන් කර තිබුණි. | -එම- | නිරීක්ෂණ සමඟ එකඟ වේ. |

### 1.6.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස දැක්වීම |
|---|---|---|---|
| | --------------------- | ---------- | ------------------------------- |
| (i) | දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධි විධාන අනුව අභ්‍යන්තර පාලන පද්ධතියෙ ඵලදායිතාවය පිළිබද වාර්තා ඉදිරියේදී විගණනයට ඉදිරිපත කිරීමට කටයුතු කරමි. |
| (ii) | වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරිම සිදු වන බවට ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර වාර්තාවේ 2.2 ඡේදවල සඳහන් විගණන නිරීක්ෂණ හේතුවෙන් එම අවශ්‍යතා ඉටු කර නොතිබුණි. | -එම- | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4 ඡේදයේ සඳහන් නිරික්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | -එම- | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**2. මෙහෙයුම් සමාලෝචනය**

**2.1. කාර්යභාරයන් ඉටු නොකිරීම**

**(අ) කටුබැද්ද පුහුණු මධ්‍යස්ථානය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස දැක්වීම |
|---|---|---|---|
| (i) | කටුබැද්ද පුහුණු මධ්‍යස්ථානයේ ශ්‍රවණාගාරයට රු.1,528,350 ක් වැයකර වායු සමීකරණ යන්ත්‍ර 06 ක් 2016 දෙසැම්බර් 28 දින සවිකර තිබුණද 2019 සැප්තැම්බර් 30 දින වන විටත් භාවිතයට ගෙන නොතිබුණි. | යන්ත්‍ර නිසි පරිදි ප්‍රයෝජනයට ගත යුතු වීම. | වායුසමීකරණ යන්ත්‍ර ක්‍රියාත්මක කරවීමට පවතින විදුලි සැපයුමෙහි ධාරිතාවය ප්‍රමාණවත් නොවන බැවින් වැඩි ධාරිතාවයකින් යුත් සැපයුයක ලබාගැනීමට මේවන විට කටයුතු සිදු කෙරෙමින් පවතී. |
| (ii) | කටුබැද්ද පුහුණු මධ්‍යස්ථානයේ ජේෂකර්මාන්ත පුහුණු පාසලෙහි අත්යන්ත්‍ර 08 ක් හා මෝස්තර පුහුණු අංශයේ අත්යන්ත්‍ර 15 ක් පැවතියද පිළිවෙලින් පුහුණුලාභීන් 2 ක් හා 4 ක් පුහුණුව ලබා තිබුණි. වෙනත් පලාත්වල ඇති අත්යන්ත්‍ර ජේෂ පාසල් වල සිටින ගුරුවරුන් පුහුණු කිරීම සඳහා මොස්තර පුහුණු අංශය පිහිටුවා ඇති අතර එහි අත්යන්ත්‍ර 08 ක් තිබුණද මෙම පාසල් 03 සඳහා ජේෂ උපදේශිකාවන් 10 දෙනෙකු අනුයුක්ත කර ඇත. ඒ අනුව පවතින මානව හා භෞතික සම්පත් ඌන උපයෝජිතව පවතින බව නිරීක්ෂණය වේ. | නිමැවුම් මට්ටම (Out put) පිළිබඳ කාර්යසාධක දර්ශක සඳහන් කර එම දර්ශක අනුව අපේක්ෂිත නිමැවුම් මට්ටම ලඟා කරගත යුතු වීම. | සිප් පියසක් සඳහා සිසු සිසුවියන 20 ක් පමණ වසරක පාඨමාලාව සඳහා බඳවා ගන්නා අතර 2019 වසරේ ඒ සංඛ්‍යාව අඩු වුවද ඉදිරි වර්ෂ වලදී ඒ සාමාන්‍ය පරිපි පැවතිය හොත් එම යන්ත්‍ර ප්‍රමාණය අවශ්‍ය වන බව කාරුණිකව දන්වා සිටිමි. |

**2.2 වාර්ෂික කාර්ය සාධන වාර්තාව**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උපවගන්තියට අනුව සෑම අස්ථිත්‍යයක් විසින්ම එහි වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාවද විගණනය | පනත ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාවද විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වීම. | 2017 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත. 2018 වර්ෂයෙ කාර්ය සාධන වාර්තාව සකස්ක‍ර දැනට දෙමළ බසට පරිවර්තනය කරමින් පවතී. |

සඳහා ඉදිරිපත් කළයුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි.

## 2.3 ප්‍රසම්පාදනයන්

(අ) සමාලෝචිත වර්ෂයේදී කටුබැද්ද පුහුණු මධ්‍යස්ථානය නවීකරණය කිරීම සඳහා රු.1,304,608 ක් ඇස්තමේන්තු කර ඇති අතර ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.10.1 (අ) උප වගන්තිය විධිවිධාන පරිදි ජාතික තරගකාරී ලංසු ක්‍රමයේදී ලංසුකරුවන්ගේ පශ්චාත් සුදුසුකම් පරීක්ෂාව ආරක්ෂක පියවරක් වශයෙන් ක්‍රියාත්මක කළ යුතු බව දැක්වුවද, ලංසු ඇගයීමේදී එම කරුණ සැලකිල්ලට ගෙන නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධි විධාන අනුගමනය කල යුතු වීම. | නිරීක්ෂණ හා එකඟ වේ. නමුත්තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඇගයීමට ලක් කරන අවස්ථාවේදී අවම මිල ඉදිරිපත් කර ඇති ආයතනයට පිරිනැමීමට ප්‍රථම එම ආයතනයේ පශ්චාත් සුදුසුකම් පරීක්ෂා කර ඇත. |
| (ii) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2007 ඔක්තෝබර් 03 දිනැති අතිරේක 14 හි 8.13.4 මාර්ගෝපදේශය ප්‍රකාරව පුහුණු මධ්‍යස්ථානය නවීකරණය කිරීමේ කොන්ත්‍රාත්තුවට අදාලව කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ මිල වූ රු.975,720 න් සියයට 10 ක් එනම් රු.97,572 ක ශුද්ධ විචලනයක් සඳහා වියදම් අනුමත කිරීම වෙනුවට ඇස්තමේන්තුගත මිලෙන් සියයට 10 ක් එනම් රු.130,450 ක විචලනයක් දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අනුමත කර තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධි විධාන අනුගමනය කල යුතු වීම. | සිදු කරන අමතර වැඩ සඳහා .129,650 ක් ගෙවා ඇත. මේ සඳහා දෙපාර්තමේන්තු ඇස්තමේන්තු මුදල රු.130,450 වේ. සියලු අතිරේක ගෙවීම 10% ඇතුලත ගෙවා ඇත. |
| (iii) | කටුබැද්ද පුහුණු මධ්‍යස්ථානය නවීකරණය කිරීම සඳහා අනුමත ඇස්තමේන්තුවේ සඳහන් අයිතමයන් 11 ක් නිමකර නොතිබුණු අතර එහි වටිනාකම රු.160,560 ක් විය. | පිරිවිතර අනුව නිමකල කාර්යයන්ට පමණක් ගෙවීම් කල යුතු වීම. | නිරීක්ෂණ හා එකඟ වේ. නමුත් අයිතම දෙකක් හැර ඉතිරි අයිතම වල යම් ප්‍රමාණයක් ඉටුකර ඇත. |

**(ආ)** කටුබැද්ද පුහුණු මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාරට ගල් ඇතිරීම හා තාර දැමීම සඳහා රු.744,782 ක් වැයකර තිබූ අතර ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------- | ---------- | ------------------------------ |
| (i) | ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ 7.8 ප්‍රකාරව ලංසුකරුවන් විසින් ඉදිරිපත් කර ඇති සාමාන්‍ය මිල ගණන් ගැලපුම් කාර්ය සඳහා යොදාගත යුතු බව දැක්වෙතත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධි විධාන අනුගමනය කල යුතු වීම. | නිරීක්ෂණ හා එකඟ වේ. ඉදිරියේදී එවැනි අවස්ථා වලදී මිල ගණන් ගැලපුම් ක්‍රමය යොදා ගැනීමට කටයුතු කරනු ඇත. |
| (ii) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.2 (අ) (ආ) මාර්ගෝපදේශ අනුව කාර්මික නිලධාරියා විසින් වැඩ අවසන් කිරීමේ සහතිකයක් ඉදිරිපත් කර නොතිබුණ අතර කොන්ත්‍රාත්කරු මුදල් ඉල්ලමින් ඉදිරිපත් කල ලිපිය තුල ලුහුඩු සටහනක් පමණක් යොදා තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධි විධාන අනුගමනය කල යුතු වීම. | නිරීක්ෂණ හා එකඟ වේ. ඉදිරියේදී තාක්ෂණ නිලධාරීගේ සහතික කරන ලද ලිපියක් ලබාගැනීමට කටයුතු කරනු ඇත. |

**3. යහපාලනය**

--------------

**3.1 අභ්‍යන්තර විගණනය**

-----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| --------------------- | ---------- | ------------------------------ |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) උප වගන්තියට අනුව දෙපාර්තමේන්තු ගණන් දීමේ නිළධාරියා විසින් සුදුසු අභ්‍යන්තර විගණකවරයෙකු පත් කල යුතු වුවද දෙපාර්තමේන්තුව සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් හා අභ්‍යන්තර විගණකවරයෙකු සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පත් කර නොතිබුණි. | විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු වීම. | පිළිතුරු ලබා දි නොමැත. |

**4. මානව සම්පත් කළමනාකරණය**

**------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අනුමත සේවක සංඛ්‍යාව 157 ක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 123 ක් වූයෙන් සේවක පුරප්පාඩු 34 ක් විය. මෙම පුරප්පාඩු පිරවීම කර නොතිබුණ අතර පරිපාලන නිලධාරී තනතුර 2008 වසරේ සිට පුරප්පාඩුව පවතී. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් සේවක පුරපුපාඩු වලට අවශ්‍ය අනුයුක්ත කිරීම් කරන ලෙස ඉල්ලා ඇත. |
| (ආ) | ඒකාබද්ධ සේවයට අයත් කාර්යමණ්ඩලයේ නිලධාරීන් 06 දෙනෙකු වසර 6 සිට වසර 10 දක්වා කාලයක් ස්ථාන මාරුවීම් නොලබා 2019 මැයි 30 දින වන විටත් දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවයේ යෙදෙමින් පැවතුණි. | අංක 03/2017 හා 2017 ජුනි 30 දින දරන ඒකාබද්ධ සේවා චක්‍රලේඛයට අනුව කටයුතු කල යුතු වීම. | එම නිළධාරීන් 6 අතුරින් නිළධාරීන් එක් අයකු මේ වන විට ස්ථාන මාරු ලබා ගොස් ඇත. |